# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 නොවැම්බර් මස 15 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2019.11.18 දින නිකුත් කරන ලදී)**

## ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 23.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය
## (සංස්ථාගත කිරීමේ)

එල්.ඩී.— ඕ. (අයි. එන්. සී.) 30/2011

### ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී සංගමය සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

1. මේ පනත 2019 අංක    දරන ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමය සංස්ථාගත කිරීම.

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටින තැනැත්තන්ගෙන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලයට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින්මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා මනෝවිද්‍යා සංගමයට" එකී නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් තිබිය යුතු ය. තව ද, එකී නාමයෙන් එම සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) මනෝවිද්‍යාව පිළිබඳ දැනුම සහ එහි ව්‍යවහාරය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සහ පැතිරවීම;

(ආ) මනෝවිද්‍යාව පිළිබඳ වෘත්තීය දැනුම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මනෝවිද්‍යාව පිළිබඳ වෘත්තීය දැනුම පිළිබඳ පර්යේෂණ ධෛර්යමත් කිරීම;

(ඇ) සාමාජිකයන්ගේ වෘත්තීය ක්‍රියාකාරකම් විධිමත් කිරීම සහ ශ්‍රී ලංකාව තුළ මනෝවිද්‍යාව ව්‍යවහාරයේ දී භාවිත කරනු ලබන උපකරණ සහ උපාංග සංවර්ධනය කිරීමේ දී, ප්‍රමිති කිරීමේ දී, භාවිතයේ දී සහ ඇගැයීමේ දී නිසි තත්ත්ව පවත්වාගෙන යාම;

(ඈ) සාමාජිකයන්ගේ වෘත්තීමය සම්බන්ධතා ආරක්ෂා කිරීම සහ දැනුම සහ වෘත්තීමය විශේෂඥතාවය වර්ධනය කිරීම පිණිස සහාය ලබා දීම;

(ඉ) මනෝවිද්‍යාව පිළිබඳ පරීක්ෂණ සහ ප්‍රකාශන සිදු කිරීම සඳහා සහාය ලබා දීම සහ අදාළ ද්‍රව්‍ය සඳහා ප්‍රවේශය ලබා ගැනීම පහසු කරලීම;

(ඊ) ආචාර ධර්ම භාවිතය ප්‍රවර්ධනය කිරීමෙහි ලා සහ සාමාජිකයන්ගේ සහ මනෝවිද්‍යා ක්ෂේත්‍රයෙහි නිරත වෙනත් අයගේ අයථා ක්‍රියා වැළැක්වීම සඳහා ආචාර ධර්ම චර්යා සංග්‍රහයක් ස්ථාපිත කිරීම;

(උ) සම්මේලන, වැඩමුළු, දේශන සංවිධානය කිරීම සහ මනෝවිද්‍යාවේ විවිධ ක්ෂේත්‍රයන් හි ජාලගත කිරීමේ අවස්ථා සපයා දීම;

(ඌ) මනෝවිද්‍යාව සහ ඊට අදාළ ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රකාශන අඩංගු වාර සඟරා පවත්වාගෙන යාම; සහ

(එ) වෘත්තීමය කටයුතු සම්බන්ධයෙන් පවත්නා ඉඩ ප්‍රස්ථාවන් පිළිබඳ තොරතුරු ප්‍රචලිත කිරීම සහ මනෝවිද්‍යාව පිළිබඳ අභිමත සුදුසුකම් සම්බන්ධයෙන් සාමාජිකයන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම.

> ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමග සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය ගැටුම් සහගත නොවන බවට සංස්ථාපිත මණ්ඩලය වගබලා ගත යුතු බව.

**4**. ආණ්ඩුවේ හෝ යම් පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය අතර, කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

> සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ රීති මඟින් නිශ්චය කරනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම සභාව පත් කරනු ලබන තෙක් හෝ තෝරා පත් කරනු ලබන තෙක්, මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරනු ලබන සංගමයේ සභාව, මේ වගන්තියේ (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව සංස්ථාපිත මණ්ඩලයේ අතුරු සභාව වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(ආ) 7 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව අතුරු සභාවට, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා සහ පළමු සභාවට සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සඳහා හෝ පත් කිරීම සඳහා අවශ්‍ය රීති සෑදීමේ බලය තිබිය යුතු ය.

(ඇ) අතුරු සභාවේ යම් තීරණයක් පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරය විසින් ගත යුතු ය.

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට එක් අවුරුද්දක කාලයක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ පළමු සභාව පත්කිරීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරු සහ උපදේශකවරු ද ඇතුළුව සභාවේ සෑම ධුර දරන්නකු ම වර්ෂ තුනක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරා පත්කර ගතයුතු අතර, එම වර්ෂ තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එම ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන්නකු මිය යාම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, සභාව විසින් සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගතයුතු හෝ පත්කර ගත යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල.

**6**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා පහත සඳහන් බලතල ද ඇතුළුව අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා හා කාරණා කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ බලය සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු යː-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්පත් කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදි කිරීමට, අලුත්වැඩියා කිරීමට සහ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සැලකෙන අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු

කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට සංස්ථාපිත මණ්ඩලය ඍජුව ම හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් තත් කාර්ය සඳහා බලය පවරන ලද නිලධරයකු මාර්ගයෙන් හෝ නියෝජිතයකු මාර්ගයෙන් ඇතුළත් වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම හෝ කරගෙන යාම;

(ඇ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය වෙත ලබා දෙනු ලබන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් සභාව විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් දීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල්, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව යම් නීත්‍යනුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය සහ විදේශීය අනෙකුත් ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හි දී සේවක පිරිස් පුහුණු කිරීම; සහ

(ඔ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ කිරීම.

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, සංස්ථාපිත මණ්ඩලයේ යම් මහසභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු යඃ- සංස්ථාපිත මණ්ඩලයේ රීති.

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) සභාවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම් නියම සහ කොන්දේසි, බලතල, කර්තව්‍ය සහ කාර්ය;

(ඈ) සභාවේ හෝ එහි යම් අනු කමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ගණපූරණය සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ සහ සභාවේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) පොදුවේ සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කරගැනීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්, එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීති *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම කල්හි ම සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය.

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපින සහ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ ලේඛනයක් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල.

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ එය වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු ම මුදල්, සභාව විසින් අනුමත කරන ලද එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තීයේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි ගණකාධිකාරි සමාගමක් හෝ,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව.

11. (1) සභාව විසින් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමඟ එකී වාර්තාව අදාළ වන වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමඟ යැවිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය මුදල්.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු සියලු ණය සහ සංගමයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**13.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතු වන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් හා දේපළ අදාළ කර ගැනීම.

**14.** කවර ආකාරයකින් හෝ ලබාගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් සහ දේපළ, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව.

**15.** (1) සභාවේ සාමාජිකයින් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි සභාවේ යම් ධුර දරන්නකුගේ භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ.

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් එම දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් සංස්ථාපිත මණ්ඩලයේ යම් මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් සංස්ථාපිත මණ්ඩලයක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.